සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

NEW **2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්** **08 S I,II**

**(නව නිර්දේශය)**

පැ තුනයි

**2018.12.28 /08.30 - 11.40** **(08) සමාජ විද්‍යාව - I, II** අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සමාජ විද්‍යාව - I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

*(ලකුණු 01 × 40 = 40 යි)*

1. සමාජ විද්‍යාව විෂය ලොවට හඳුන්වා දුන් ප්‍රංශ ජාතික දාර්ශනිකයා වන්නේ,
   (1) එමිල් ඩුර්ක්හයිම් ය. (2) ඔගස්ට් කොම්ට් ය.
   (3) හර්බට් ස්පෙන්සර් ය. (4) කාල් මාක්ස් ය.

2. වෙබේරියානු සමාජ විද්‍යාවේ ඉගැන්වීම් පමණක් සඳහන් වන පිළිතුර කුමක් ද?
   (1) නිලබල ක්‍රමය, ආධිපත්‍ය වර්ගීකරණය, සමාජ ක්‍රියා න්‍යාය
   (2) සමාජ ක්‍රියා න්‍යාය, පන්ති ගැටුම් න්‍යාය, සිය දිවි නසා ගැනීමේ සිද්ධාන්ත
   (3) පන්ති ගැටුම් න්‍යාය, නිලබල ක්‍රමය, ආධිපත්‍ය වර්ගීකරණය
   (4) සියදිවි නසා ගැනීමේ සිද්ධාන්ත, පන්ති ගැටුම් න්‍යාය, නිලබල ක්‍රමය

3. යුතුකම් සහ වගකීම් නිවැරදිව ඉටු කිරීම තුළින් සමාජ යහපැවැත්ම තහවුරු වන බව දැක්වෙන බෞද්ධ සූත්‍රය වන්නේ,
   (1) මහා මංගල සූත්‍රයයි. (2) වසල සූත්‍රයයි.
   (3) සිගාලෝවාද සූත්‍රයයි. (4) පරාභව සූත්‍රයයි.

4. "සමාජ විද්‍යාව යනු මානව සමාජය පිළිබඳව අධ්‍යයනය කිරීමයි" යනුවෙන් සමාජ විද්‍යාව අර්ථකථනය කළ සමාජ විද්‍යාඥයා කවුද?
   (1) ජෝන් ස්ටුවට් මිල් (2) එල්. ටී. හොබ්හවුස්
   (3) කිංස්ලි ඩේවිස් (4) එලිසබත් ජේ. විල්කින්ස්

5. සමාජ පරිණාමය පිළිබඳ අවධි කිහිපයක් පහත දැක්වේ.
   *A* – රණකාමී අවධිය
   *B* – දේවවාදී අවධිය
   *C* – ධනවාදී අවධිය
   *D* – කාර්මික අවධිය
   ඉහත සඳහන් ඒවායින් හර්බට් ස්පෙන්සර් පෙන්වා දුන් අවධි දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
   (1) *A* සහ *C* (2) *A* සහ *D* (3) *B* සහ *C* (4) *B* සහ *D*

[ 2 වැනි පිටුව බලන්න.

6. ශ්‍රී ලංකාවට පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ලැබීමට බලපෑ ආසන්න ම සමාජ වෙනස්වීමේ කාරකය වූයේ,
   (1) නවීකරණයයි. (2) කාර්මීකරණයයි. (3) බටහිරකරණයයි. (4) නාගරීකරණයයි.

7. කතෝලික පල්ලියේ ආධිපත්‍යයට එරෙහිව ප්‍රොතෙස්තන්ත්‍ර ආචාරධර්ම හඳුන්වා දෙනු ලැබුයේ,
   (1) මැක්ස් වෙබර් ය. (2) මාටින් ලූතර් ය. (3) විල්බට් මුවර් ය. (4) ජෝන් කැල්වින් ය.

8. පහත සඳහන් කරුණු සලකා බලන්න.
   *A* – ශ්‍රම විභජනය ඇති වීම
   *B* – මිනිස් ශ්‍රමය වෙනුවට යන්ත්‍ර ආදේශ වීම
   *C* – සාම්ප්‍රදායික සංස්කෘතික සබඳතා වර්ධනය වීම
   *D* – ගෘහස්ත කර්මාන්ත මහා පරිමාණ කර්මාන්ත බවට පත්වීම

   ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් කාර්මීකරණය නිසා ඇති වූ ප්‍රතිඵල නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) *A, B* සහ *C* (2) *A, B* සහ *D* (3) *A, C* සහ *D* (4) *B, C* සහ *D*

9. රාජ්‍ය පාලකයා විසින් ජනතාවගේ ආර්ථික සංවර්ධනය උදෙසා කටයුතු කළ යුතු ආකාරය සඳහන් වන සූත්‍රය ඇතුළත් පිළිතුර කුමක් ද?
   (1) මහා මංගල සූත්‍රය (2) අග්ගඤ්ඤ සූත්‍රය
   (3) කූටදන්ත සූත්‍රය (4) චූල්ලහත්ථිපදෝපම සූත්‍රය

10. සමාජ පරිණාමය පිළිබඳව කාල් මාක්ස් පෙන්වා දුන් අවධි අතර පන්ති විරහිත සමාජ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
   (1) ප්‍රාග් කොමියුනිස්ට් අවධිය, සමාජවාදී අවධිය, සුපිරි කොමියුනිස්ට් අවධිය
   (2) වහල් අවධිය, වැඩවසම් අවධිය, සමාජවාදී අවධිය
   (3) ධනවාදී අවධිය, සමාජවාදී අවධිය, සුපිරි කොමියුනිස්ට් අවධිය
   (4) වැඩවසම් අවධිය, ධනවාදී අවධිය, ප්‍රාග් කොමියුනිස්ට් අවධිය

11. සමාජ වෙනස් වීමේ සාධක තුනක් සහ ඒ සඳහා බලපෑ හේතු තුනක් පහත දැක්වේ.

| සාධකය | හේතුව |
|---|---|
| 1. නවීකරණය | *A* – සංක්‍රමණිකයන්ගේ පැමිණීම |
| 2. නාගරීකරණය | *B* – යටත් විජිත බිහි වීම |
| 3. බටහිරකරණය | *C* – ප්‍රංශ විප්ලවය |

   එක් එක් සාධකය සඳහා වඩාත් බලපෑම් ඇති කළ හේතුව අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
   (1) *A, B, C* (2) *A, C, D* (3) *C, A, B* (4) *C, B, A*

● අංක **12** සහ **13** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රකාශ උපයෝගී කරගන්න.
   *A* – සංවර්ධිත රටවල පවතින දියුණු තාක්ෂණය නොදියුණු සමාජවලට හඳුන්වා දීම
   *B* – විවිධ විලාසිතා සමාජගත කිරීම සඳහා මෝස්තර ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම
   *C* – ගෘහස්ථ කර්මාන්ත වෙනුවට මහා පරිමාණ කර්මාන්ත ව්‍යාප්ත වීම
   *D* – මත්ද්‍රව්‍ය උවදුරින් සමාජය ගලවා ගැනීම සඳහා අමද්‍යප සංවිධාන බිහි වීම

12. දිගුකාලීන සමාජ වෙනස්වීමේ සාධක සමග සෘජු සම්බන්ධතාවක් ඇති ප්‍රකාශ දෙකක් වන්නේ,
   (1) *A* සහ *B* ය. (2) *A* සහ *C* ය. (3) *B* සහ *C* ය. (4) *B* සහ *D* ය.

13. කෙටිකාලීන සමාජ වෙනස්වීමේ සාධක සමග සෘජු සම්බන්ධතාවක් ඇති ප්‍රකාශ දෙකක් වන්නේ,
   (1) *A* සහ *C* ය. (2) *A* සහ *D* ය. (3) *B* සහ *C* ය. (4) *B* සහ *D* ය.

14. සමාජයේ ප්‍රභවය, විකාශනය, දියුණුව සහ පිරිහීම පිළිබඳව සඳහන් බෞද්ධ සූත්‍ර ධර්මය කුමක් ද?
   (1) වසල සූත්‍රය (2) චක්කවත්ති සීහනාද සූත්‍රය
   (3) කූටදන්ත සූත්‍රය (4) අග්ගඤ්ඤ සූත්‍රය

[ 3 වැනි පිටුව බලන්න.

15. පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්න.

*A* – යැපුම් ආර්ථිකයට වඩා ව්‍යාපාරික ආර්ථිකය බලවත් වීම
*B* – රාජාණ්ඩු පාලනය වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම ස්ථාපිත වීම
*C* – සමාජ පන්තිය වෙනුවට කුල ස්තරායනය වැදගත් කොට සැලකීම
*D* – ආරෝපිත තත්ත්වයට වඩා සාධිත තත්ත්වය ප්‍රධාන වීම

ඉහත සඳහන් ඒවා අතුරින් ප්‍රාථමික මට්ටමේ සිට නූතනත්වය දක්වා පරිණාමය වූ සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ **පමණක්** ඇතුළත් වරණය තෝරන්න.

(1) *A, B* සහ *D* (2) *A, B* සහ *C* (3) *A, C* සහ *D* (4) *B, C* සහ *D*

16. ගුණාත්මක බවින් පිරිපුන් සමාජයක් ගොඩනගා ගැනීම සඳහා ව්‍යග්ඝපජ්ජ සූත්‍රය මගින් පෙන්වා දී ඇති කරුණු ඇතුළත් වරණය තෝරන්න.

(1) උත්සාහයෙන් කටයුතු කිරීම, තම වස්තුව ආරක්ෂා කිරීම, හොඳ මිතුරන් ඇසුරු කිරීම, දෙමව්පියන්ට උපස්ථාන කිරීම
(2) තම වස්තුව ආරක්ෂා කිරීම, හොඳ මිතුරන් ඇසුරු කිරීම, දෙමව්පියන්ට උපස්ථාන කිරීම, වැරදි චර්යාවලින් වැළකීම
(3) සැහැල්ලු ජීවිතයක් ගත කිරීම, උත්සාහයෙන් කටයුතු කිරීම, යුතුකම් හා වගකීම් ඉටු කිරීම, අවිහිංසාවාදී ජීවිතයක් ගත කිරීම
(4) හොඳ මිතුරන් ඇසුරු කිරීම, සැහැල්ලු ජීවිතයක් ගත කිරීම, තම වස්තුව ආරක්ෂා කිරීම, උත්සාහයෙන් කටයුතු කිරීම

17. සංස්කෘතියේ ප්‍රධාන කොටස් දෙක ඇතුළත් වරණය කුමක් ද?

(1) මහා සංස්කෘතිය සහ උපසංස්කෘතිය
(2) භෞතික සංස්කෘතිය සහ අභෞතික සංස්කෘතිය
(3) සාරධර්ම සංස්කෘතිය සහ භෞතික සංස්කෘතිය
(4) අභෞතික සංස්කෘතිය සහ යථාර්ථවාදී සංස්කෘතිය

18. භෞතික දියුණුවට සාපේක්ෂ ව අදහස් සහ සම්ප්‍රදායවල වෙනස් වීමේ වේගයේ අසමබරතාව හඳුන්වන්නේ,

(1) සංස්කෘතික ලැග්ම ලෙස ය. (2) සංස්කෘතික විසරණය ලෙස ය.
(3) සංස්කෘතික ගැටුම ලෙස ය. (4) සංස්කෘතික සම්පර්කය ලෙස ය.

19. සංස්කෘතියේ සඳහන් ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

සංස්කෘතිය කාලාන්තරයක් තිස්සේ හැඩගැසෙමින් සකස් වන්නකි.
සංස්කෘතිය යනු මිනිසා විසින් ඉගෙන ගනු ලබන්නකි.
සංස්කෘතිය අපගේ චර්යාවලට මගපෙන්වනු ලබයි.

ඉහත දක්වා ඇති සංස්කෘතියේ වැදගත් ලක්ෂණ පෙන්වා දුන් මානව විද්‍යාඥයා කවුද?

(1) ඊ. බී. ටයිලර් (2) රැල්ෆ් ලින්ටන්
(3) රේමන්ඩ් ෆර්ත් (4) බී. මැලිනොවුස්කි

20. ශ්‍රී ලංකාව සමග සම්බන්ධතා පැවැත්වූ රටවල් කිහිපයක් *'X'* තීරුවේ ද එම රටවලින් ලැබුණු සංස්කෘතික දායාද කිහිපයක් *'Y'* තීරුවේ ද දැක්වේ.

| *'X'* | *'Y'* |
|---|---|
| 1. ඉන්දියාව | *A* – රෝම ලන්දේසි නීති පද්ධතිය |
| 2. පෘතුගාලය | *B* – කව්චේරි ක්‍රමය |
| 3. ඕලන්දය | *C* – තෝම්බු ක්‍රමය |
| 4. බ්‍රිතාන්‍ය | *D* – සිද්ධ ආයුර්වේද සම්ප්‍රදාය |

ඉහත *Y* තීරුවේ සඳහන් ඒවා *X* තීරුවේ අනුපිළිවෙළට නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) *A, B, D, C* (2) *B, A, C, D* (3) *C, A, D, B* (4) *D, C, A, B*

[ 4 වැනි පිටුව බලන්න.

21. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
*A* – සමාජය විසින් සම්මත කරගත් හැසිරීම් සමුදායකි.
*B* – මූලික සමාජවල චාරිත්‍ර සහ වාරිත්‍ර ලෙසත්, නූතන සමාජවල නීති ලෙසත් ක්‍රියාත්මක වේ.
*C* – සමාජවල මිනිසුන්ගේ සිතුම් පැතුම් සමුදායයි.
*D* – කාලයෙන් කාලයට, සමාජයෙන් සමාජයට වෙනස් වේ.
ඉහත සඳහන් ඒවා අතුරින් ධර්මතා සම්බන්ධයෙන් වඩාත් ම නිවැරදි කරුණු දැක්වෙන වරණය තෝරන්න.
(1) *A, B* සහ *C* (2) *A, B* සහ *D* (3) *A, C* සහ *D* (4) *B, C* සහ *D*

22. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
*A* – ආගමික වශයෙන් විවිධත්වයක් පැවතීම
*B* – විවිධ ජාතීන් සහ ජන කණ්ඩායම් එකට වාසය කිරීම
*C* – සංස්කෘතික විවිධත්වය අඩුකම
*D* – භාෂා කිහිපයක් භාවිත කිරීම
ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් බහු සමාජයක් සම්බන්ධයෙන් නිවැරදි කරුණු අඩංගු වරණය තෝරන්න.
(1) *A, B* සහ *C* (2) *A, B* සහ *D* (3) *A, C* සහ *D* (4) *B, C* සහ *D*

23. පෞරුෂ සංවර්ධනය කෙරෙහි පාරිසරික සහ සංස්කෘතික සාධකවල බලපෑම ඉතා හොඳින් පැහැදිලි වන ජාතක කතාව වන්නේ,
(1) මහා සුපින ජාතකයයි. (2) ඉල්ලීස ජාතකයයි.
(3) සාම ජාතකයයි. (4) සත්තිගුම්භ ජාතකයයි.

24. දරුවා මව් කුසේ කලල අවස්ථාවේ සිට මවගෙන් සමාජානුයෝජනය වන බව දැක්වෙන බෞද්ධ සූත්‍රය වන්නේ,
(1) ඉන්ද්‍රික සූත්‍රයයි. (2) පරාභව සූත්‍රයයි.
(3) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි. (4) වසල සූත්‍රයයි.

25. පුද්ගලයකු සමාජය තුළ ඇගයීමට ලක් කළ යුත්තේ ආරෝපිත තත්ත්වය මත නොව සාධිත තත්ත්වය මත බව සඳහන් වන බෞද්ධ සූත්‍රය කුමක් ද?
(1) වසල සූත්‍රය (2) චක්කවත්ති සීහනාද සූත්‍රය
(3) අග්ගඤ්ඤ සූත්‍රය (4) සිගාලෝවාද සූත්‍රය

26. ශ්‍රී ලාංකික සමාජයේ සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික වශයෙන් වෙනස්කම් රැසකට තුඩු දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන් වර්ෂය කුමක් ද?
(1) 1972 (2) 1977 (3) 1982 (4) 2001

27. අතීත ශ්‍රී ලාංකික සමාජයේ 'ගමික' යන තනතුරට අදාළ ප්‍රධාන කාර්යය වූයේ,
(1) ගම පිරිසිදු කිරීමයි.
(2) ගමෙහි සංචාරය කිරීමයි.
(3) ගමෙහි කෘෂිකාර්මික කටයුතුවල යෙදීමයි.
(4) ගම පාලනය කිරීමයි.

28. පහත සඳහන් කරුණු සලකා බලන්න.
*A* – මනා සංයමයක් සහ විනයගරුක බවක් තිබීම
*B* – අගතියෙන් තොරව යමක් විග්‍රහ කිරීමේ හැකියාව තිබීම
*C* – හැදෑරූ විෂයයන් පිළිබඳ මනා නිපුණතාවක් තිබීම
*D* – තම සංස්කෘතිය පමණක් ඇගයීමේ හැකියාව තිබීම
ඉහත සඳහන් ඒවා අතුරින් පූර්ණ අධ්‍යාපනයක් තුළින් බිහි කරන පුරවැසියකු තුළ තිබිය යුතු ගුණාංග ඇතුළත් වරණය තෝරන්න.
(1) *A, B* සහ *D* (2) *A, B* සහ *C* (3) *A, C* සහ *D* (4) *B, C* සහ *D*

[ 5 වැනි පිටුව බලන්න.

29. ස්වයං විනයක් ඇති කර ගැනීම සඳහා හේතු නොවන්නේ,
   (1) ලද දෙයින් සතුටු වීමයි.
   (2) අල්පේච්ඡ බවයි.
   (3) පෝෂණය අපහසු වීමයි.
   (4) සැහැල්ලු පැවතුම් ඇති බවයි.

30. අවසාන අභියාචනා අධිකරණ බලය හිමි ශ්‍රී ලංකාවේ උත්තරීතර අධිකරණ ආයතනය වන්නේ,
   (1) ශ්‍රේෂ්ඨාධිකරණයයි.   (2) මහාධිකරණයයි.
   (3) අභියාචනා අධිකරණයයි.   (4) මහේස්ත්‍රාත් අධිකරණයයි.

31. ස්වයං පාලනයක් ඇති කර ගැනීමට උපකාරී වන සහ සමාජයේ සෑම දෙයක ම ස්වභාවය අනියත බව අවබෝධ කර ගැනීමට හැකි භාවනාව වන්නේ,
   (1) මෙත්තානුස්සති භාවනාවයි.   (2) මරණානුස්සති භාවනාවයි.
   (3) බුද්ධානුස්සති භාවනාවයි.   (4) අසුභානුස්සති භාවනාවයි.

32. පහත දැක්වෙන ප්‍රකාශ සැලකිල්ලට ගන්න.
   *A* – සමාජය තුළින් ම මතු වී සැලකිය යුතු පිරිසකට බලපෑම
   *B* – රාජ්‍ය අධිකාරී බලය යොදා විසඳා ගැනීමට හැකි වීම
   *C* – සමාජයේ සාමාජිකයන්ට අයහපත් ලෙස බලපෑම
   *D* – 'සාමූහික ක්‍රියාමාර්ගයක් තුළින් විසඳා ගැනීමට හැකි ය' යන විශ්වාසය පැවතීම
   ඉහත ප්‍රකාශ අතුරින් සමාජ ප්‍රශ්නයක් හඳුනා ගැනීමට හැකි ලක්ෂණ ඇතුළත් වරණය තෝරන්න.
   (1) *A, B* සහ *C*   (2) *A, B* සහ *D*   (3) *A, C* සහ *D*   (4) *B, C* සහ *D*

● පහත සඳහන් *A, B, C* සහ *D* යන සිද්ධි යුගල අධ්‍යයනය කර, අංක **33** සහ **34** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   *A* – (i) ජනවාර්ගික සමගිය
         (ii) යුධ ගැටුම් පිළිබඳ අවදානම
   *B* – (i) ලිංගික අධ්‍යාපනය
         (ii) ඒඩ්ස් රෝගය වැළඳීමේ අවදානම
   *C* – (i) දුගී බව ආශ්‍රිතව ගොඩනැගෙන ඉච්ඡාභංගත්වය
         (ii) සිය දිවි හානිකර ගැනීමේ අවදානම
   *D* – (i) සමාජ ධර්මතා බිඳවැටීම
         (ii) අපරාධ වර්ධනය වීමේ අවදානම

33. පළමුවැන්නේ වැඩි වීම, දෙවැන්නේ අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක වන්නේ,
   (1) *A* සහ *B* ය.   (2) *A* සහ *C* ය.   (3) *A* සහ *D* ය.   (4) *B* සහ *D* ය.

34. පළමුවැන්නේ වැඩි වීම, දෙවැන්නේ වැඩි වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක වන්නේ,
   (1) *A* සහ *C* ය.   (2) *A* සහ *D* ය.   (3) *B* සහ *C* ය.   (4) *C* සහ *D* ය.

35. පහත සඳහන් කරුණු සලකා බලන්න.
   *A* – ජාතීන් අතර අභිමානවත්භාවය සහ විශ්වාසය ගොඩනැගීම
   *B* – එක් එක් ජනවර්ග සඳහා වෙන වෙන ම භූමි වෙන් කර දීම
   *C* – ජාතීන් අතර මූලික අයිතිවාසිකම් සහ අවශ්‍යතා සපිරෙන සමාජ පරිසරයක් ඇති කිරීම
   *D* – ඒ ඒ ජාතීන්ගේ ප්‍රගතිය උදෙසා ඇති අවස්ථා තහවුරු කර දීම
   ඉහත සඳහන් ඒවා අතුරින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය වළක්වා ගැනීමට සුදුසු යෝජනා මොනවා ද?
   (1) *A, B* සහ *C*   (2) *A, B* සහ *D*   (3) *A, C* සහ *D*   (4) *B, C* සහ *D*

[ 6 වැනි පිටුව බලන්න.

36. වර්තමානයේ සිදුවන දේ පිළිබඳව විද්‍යාත්මකව සොයා බැලීම සඳහා කරනු ලබන පර්යේෂණ වර්ගය කුමක් ද?

(1) විස්තරාත්මක පර්යේෂණ
(2) ඓතිහාසික පර්යේෂණ
(3) සහසම්බන්ධතා පර්යේෂණ
(4) අත්හදා බැලීමේ පර්යේෂණ

37. ලේඛන කුසලතා නොමැති ප්‍රාථමික සමාජයකින් තොරතුරු ලබා ගැනීමට ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීම යනු ප්‍රශ්නාවලියේ,

(1) වලංගුතාව පිළිබඳ දෝෂයකි.
(2) විශ්වසනීයතාව පිළිබඳ දෝෂයකි.
(3) වාස්තවික බව පිළිබඳ දෝෂයකි.
(4) ප්‍රායෝගික බව පිළිබඳ දෝෂයකි.

● පහත සඳහන් සිද්ධිය ඇසුරින් **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිසුන්ගේ විභාග ප්‍රතිඵල දුර්වල වීම පිළිබඳ පර්යේෂණයක නිරත වූ සුමන හිමියන් අනුගමනය කළ ක්‍රියා පටිපාටියෙහි ඇතුළත්ව පැවති පියවර තුනක් පහත දැක්වේ.

* පෙර දී සිදුකර ඇති මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණ පිළිබඳ ව සොයා බැලීම
* තොරතුරු ලබා ගැනීම සඳහා යෝග්‍ය ශිෂ්‍ය සහ ගුරු පිරිසක් හඳුනා ගැනීම
* විභාග ප්‍රතිඵල අඩු වීමට හේතු වී ඇත්තේ භාෂා දුර්වලතාව ද යන්න පිළිබඳ සැක පහළ කිරීම

38. මෙහි දී සුමන හිමියන් විසින් සිදු කරන ලද පෙර පර්යේෂණ තොරතුරු සහ ලිපි ලේඛන අධ්‍යයනය, පර්යේෂණ ක්‍රම විද්‍යාවේ දී හඳුන්වන්නේ,

(1) දත්ත රැස්කිරීම ලෙස ය.
(2) සාහිත්‍ය විමර්ශනය ලෙස ය.
(3) ලේඛන පරීක්ෂාව ලෙස ය.
(4) ගැටලු විග්‍රහය ලෙස ය.

39. තොරතුරු ලබා ගැනීම සඳහා තෝරාගත් පිරිවෙන් සිසුන් දහදෙනකු, සමස්ත පිරිවෙන් සිසුන්ගෙන් තෝරාගත්,

(1) නියැදියක් වේ. (2) සංගහනයක් වේ. (3) කණ්ඩායමක් වේ. (4) සමස්ත ජනගහනය වේ.

40. මෙම පර්යේෂණයේ දී ගොඩනගා ගත් උපන්‍යාසයක් වීමට වඩාත් ඉඩ ඇති වැකියක් විය හැක්කේ කුමක් ද?

(1) විභාග ප්‍රතිඵල අඩු වීම
(2) සිසුන්ගේ උනන්දුව පිරිහීම
(3) සිසුන්ගේ භාෂා හැකියාව පිළිබඳ ගැටලු පැවතීම
(4) ගුරුවරුන්ගේ ඉගැන්වීම් කටයුතුවලට දක්වන උනන්දුව පිරිහීම

* *

[ 7 වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**NEW** **2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්** **08 S I,II**

**(නව නිර්දේශය)**

**(08) සමාජ විද්‍යාව - I, II**

**සමාජ විද්‍යාව - II පත්‍රය**

※ පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) සමාජ ලෝකය පිළිබඳව අධ්‍යයනය කරන විෂයයන් දෙකක් සඳහන් කරන්න.
(ii) සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් මූලික සංකල්ප දෙකක් සඳහන් කරන්න.
(iii) සමාජ පරිණාමය පිළිබඳව එමිල් ඩූර්ක්හයිම් දැක්වූ ආකාර දෙක නම් කරන්න.
(iv) බුදු දහමට අනුව සමාජයක් පරිණාමය වන විට දියුණු විය යුතු ක්ෂේත්‍ර දෙක මොනවා ද?
(v) සංස්කෘතිය මගින් ඉටු වන ප්‍රධාන සේවා දෙකක් සඳහන් කරන්න.
(vi) ආගමික සමාජ සංස්ථාවක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ දෙක සඳහන් කරන්න.
(vii) සමාජ පාලනය සිදුවන ප්‍රධාන ක්‍රම දෙක මොනවා ද?
(viii) බෞද්ධ සමාජ ව්‍යුහයේ ප්‍රධාන ස්තර දෙක නම් කරන්න.
(ix) ශ්‍රී ලාංකේය සමාජයේ දක්නට ලැබෙන සමාජ ප්‍රශ්න දෙකක් සඳහන් කරන්න.
(x) සමාජ පර්යේෂණයක ප්‍රතිඵල ප්‍රයෝජනයට ගත හැකි ප්‍රධාන ආකාර දෙක නම් කරන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

**2.** (i) 'සමාජයක්' යනු කුමක් දැයි අර්ථකථනය කරන්න. *(ලකුණු 02 යි)*
(ii) සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා එමිල් ඩූර්ක්හයිම්ගෙන් සිදු වූ සේවා තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*
(iii) බෞද්ධ සමාජ විද්‍යාවේ න්‍යායාත්මක පදනම, සංවිධානාත්මක සමාජයක් ගොඩනැගීම කෙරෙහි උපයෝගී කර ගත හැකි ආකාරය සාධක දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**3.** (i) 'සමාජ පරිණාමය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?. *(ලකුණු 02 යි)*
(ii) "නාගරීකරණයේ ව්‍යාප්තිය සමාජයට හිතකර මෙන් ම අහිතකර ලෙස ද බලපායි". මෙම ප්‍රකාශයට අදාළව හිතකර සහ අහිතකර ලක්ෂණය බැගින් ඉදිරිපත් කර පහදන්න. *(ලකුණු 03 යි)*
(iii) සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ මතය නිදසුන් දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න. *(ලකුණු 05 යි)*

**4.** (i) සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් සපයන්න. *(ලකුණු 02 යි)*
(ii) පුද්ගල පෞරුෂ වර්ධනය කෙරෙහි සංස්කෘතික පරිසරය බලපාන ආකාරය පිළිබඳ නිදසුන් තුනක් දක්වන්න. *(ලකුණු 03 යි)*
(iii) ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලාංකේය සංස්කෘතියට එල්ල වූ අභියෝග ජය ගැනීම සඳහා බෞද්ධ නායකයින් කටයුතු කළ ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් අගය කරන්න. *(ලකුණු 05 යි)*

[ 8 වැනි පිටුව බලන්න.

**5.** (i) ශ්‍රී ලංකා සමාජයේ ප්‍රභවය සහ පරිණාමය පිළිබඳ ඓතිහාසික තොරතුරු ලබාගත හැකි දේශීය කෘති දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) "ශ්‍රී ලංකාවේ පැරණි ගැමි සමාජය යාන්ත්‍රික ඒකාබද්ධතාවක් සහිත සමාජයකි". මෙම ප්‍රකාශය සනාථ කිරීම සඳහා නිදසුන් තුනක් සපයන්න. *(ලකුණු 03 යි)*

(iii) යුක්තිගරුක සමාජයක් ගොඩනැගීම සඳහා බුදුදහමේ ඉගැන්වීම් උපයෝගී කර ගත හැකි ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**6.** (i) වරදකරුවන් බන්ධනාගාරගත කිරීමෙන් අපේක්ෂා කරන ප්‍රධාන අරමුණු දෙක මොනවා ද? *(ලකුණු 02 යි)*

(ii) මැක්ස් වෙබර් විසින් පෙන්වා දුන් ආධිපත්‍යයේ ආකාර තුන සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) පුද්ගල ස්වයං පාලනය උදෙසා පංච ශීලයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**7.** (i) මත්ද්‍රව්‍ය භාවිතය ව්‍යාප්ත වීම තුළින් ඇති විය හැකි සමාජ ප්‍රශ්න දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ශ්‍රී ලංකාවේ සියදිවි හානිකර ගැනීම් වැඩි වීමට බලපාන හේතු තුනක් පෙන්වා දෙන්න. *(ලකුණු 03 යි)*

(iii) "ධර්මතා විරහිත සමාජයක් තුළ සමාජ ප්‍රශ්න බහුලව සිදු වන අතර එය සමාජ පරිහානියට ද හේතු වේ." එසේ සමාජ පරිහානියට පත්වීම සඳහා බලපාන හේතු පරාභව සූත්‍රයේ සඳහන් කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

**8.** (i) සමාජ විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීමේ දී තොරතුරු රැස්කිරීම සඳහා භාවිත කෙරෙන මූලාශ්‍රය බෙදිය හැකි කාණ්ඩ දෙක මොනවා ද? *(ලකුණු 02 යි)*

(ii) සමාජ විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) පර්යේෂණයක් සිදු කිරීම සඳහා සුදුසු සරල මාතෘකාවක් සඳහන් කර, එම මාතෘකාව යටතේ පර්යේෂණය සිදු කිරීම සඳහා කාල රාමුවක් සකස් කරන්න. *(ලකුණු 05 යි)*

* * *